**අධ්‍යාපන අමාත්‍යාංශය**
கல்வி அமைச்சு
**Ministry of Education**

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2024
கல்விப் பொதுத் தராதரப் பத்திர (cau; தர)ப் பரீட்சை, 2024
General Certificate of Education (Adv.Level) Examination, 2024

සිංහල I
சிங்களம் I
Sinhala I

**71 S I**

පැය තුනයි
மூன்று மணித்தியாலம்
*Three hours*

**අමතර කියවීම් කාලය - මිනිත්තු 10යි**
மேலதிக வாசிப்பு நேரம் - 10 நிமிடங்கள்
Additional Reading Time-10 minutes

**අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේ දී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදා ගන්න.**

**උපදෙස්:**

❖ **පළමු** ප්‍රශ්නය ඇතුළු ව ප්‍රශ්න **පහකට** පිළිතුරු සපයන්න.

**1.** පහත දැක්වෙන **(අ), (ආ), (ඉ), (ඊ)** හා **(උ)** යන උද්ධෘත අතුරෙන් **සතරක්** තෝරා ගෙන ඒ ඇසුරෙන් අසා ඇති ප්‍රශ්නවලට ද **(ඌ)** හා **(එ)** ප්‍රශ්නවලට ද පිළිතුරු සපයන්න. (මේ ප්‍රශ්නයට පිළිතුරු ලිවීමේ දී වර්තමාන ලේඛන ව්‍යවහාරය ම යොදා ගන්න.)

**(අ)** සිටු දුවණියෝත් තුන් විටක් **පැදකුණු කොටලා** සතර තැනෙක සිට වැඳලා "ස්වාමීනි, මේ කෙළවර දැක්මය. මෙවක් පටන් මුඹවහන්සේගේ මා දැක්මකුත් මාගේ මුඹවහන්සේ දැක්මකුත් නැතැ"යි කියාලා ඉදිරි දිසාවේ සිටත් සිපගෙනපියා පිටිපස්සේ සිටත් සිප ගෙනපියා කුමක් දෝහෝයි සිතමින් ගල් කෙළවර පමා ව සිටියහු තුමු පිටිපස්වලා එක් අතෙකින් බොටුව අල්වාගෙන එක් අතෙකින් පිටිමුල අල්වාගෙන ඌගේ කායබල තරමට තමන්ගේ ඥානාකෘති වූ මායාබලය මහත් හෙයින් ගල්මුදුනෙන් දැමූව. හෙතෙම කඩ කඩ ව ගලින් හී මිය තෙමේ ම බිලි විය. සොරපව්වේ වසන දෙවතාවාණෝ උන් දෙන්නාගේ ම කටයුත්ත දැක 'හැමතැනදී ම පිරිමින් උපදෙස් දනිතී නැත. සමහර තැනක ගෑනු ද උපදෙස් දනිතී' කිවුය.

(i) මෙහි සඳහන් සිටු දුවගේ නම සඳහන් කරන්න.
(ii) මේ සිදුවීම දෙස බලා සිටි දේවතාවා පැවසුයේ කුමක් ද?
(iii) "තමන්ගේ ඥානාකෘති වූ මායාබලය මහත් හෙයින් ගල් මුදුනෙන් දැමූව" මෙය ලිහිල් බසින් ලියන්න.
(iv) **'පැදකුණු කොටලා'** යන්නට කෙටි විවරණ සපයන්න.

(ලකුණු 04 යි.)

**(ආ)** එබසට අනුරුද්ධකුමාරයෝ "යහළු, ජරාමරණදෙදෙනාගේ පසු පළමු වීමෙහි විභාගයෙක් නැත. සමහර කලෙක ජරාව පළමුව යෙයි. සමහර කලෙක ජරාවට මරණ පළමුව යෙයි. තෙලෙ නුවණෙක් නොවෙයි. අප බුදුහු **එකුන්තිස්** ඇවිරිද්දෙහි කාමසුව හැර සත්දවසකින් ලැබෙන සක්විතිරජය හැර මහණ වූහ. උදායින් ආදි වූ මෙම නුවර මහඇමතියෝ ද නව යෞවනයෙහි මහණව අමාමහනිවන් දැක දැන් අප ඉස පියපස් වගුරුවාගෙන ආකාශයෙහි ඇවිදිති. අපි ඔවුන් වඳුම්හ; පුදම්හ; සත්කාර කරම්හ; මෙයිදු ලජ්ජාවකට ඇත. කාමසුව විඳීම නම් නුවණැසින් බැලූ කල සුව විඳීමෙක් නොවෙයි; දුක්විඳීමෙක; එකලාව වලට ගොස් තපස් කිරීම නම් විශේෂයෙන් බැලූ කල දුක් විඳීමෙක් නොවෙයි; ඒකාන්ත සුව විඳීමෙක. යහළු' දෙබසක් නොකියව; මහණ වන්නට යම්හ." යි කීහ.



iexamhub
www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers · Model Answers · Study Resources

(i) මෙහි දැක්වෙන අනුපිළිවෙළ නොවැදගත් වන කරුණු දෙක සඳහන් කරන්න.
(ii) මෙහි සුව විඳීමෙක් ලෙස සලකා ඇත්තේ කුමක් ද?
(iii) 'අප ඉස පියපස් වගුරුවාගෙන ආකාශයෙහි ඇවිදිති' මෙය ලිහිල් බසින් ලියන්න
(iv) **'එකුන්තිස්'** යන්නට කෙටි විවරණ සපයන්න.

(ලකුණු 04 යි.)

**(ඉ)** වැළිත් "මේ සෝක දුක්ඛය උදක් මාගේ ම ජීවිත අපේක්ෂාවේ ම නොවෙයි. මා මළ කල්හි මාගේ වියෝග ශෝකයෙන් හඬා පෙර මා හා සමඟ එක් ව කෙළ ඇවිද ලියමඩුලු වන ලැහැප් අතළ ගල් ගං හිස් ගිරිමුදුන් රුක් යට වැලිතලාදි වූ ඒ ඒ තැන්හි අඬා ඇවිදිනා තිගේ අඳෝනාකම් අපේක්ෂා කරන්නා වූ මම හඬන්නෙමි" යනාදීන් මෙසේ ඒ මහ බෝසත් අඬා මල් ඇතිරිය මත්තේ ස්මෘති විප්‍රයෝගී ව අනික් ඇලයට පෙරළී වැද හොත්තේ ය. රජ ද විදි තැන ම සිටියේ ය. චන්ද්‍රිකා නම් කින්නරාඞ්ගනා තොම මහ බෝසත්හු මෙලෙස හඬතත් තමාගේ කෙළියෙහි ඇලී මත් වන ලද්දී බෝසත්හු විත් කෑ නියාවත් නොදන්නීය. එතකුදු උවත් මහ බෝසත්හු **විසංඥ ව** වැදහොත් නියාව දැක "ඇයි මාගේ ස්වාමි පුරුෂයාණන් මී නියා වූ මගේ නැටුම් නොබලා වැදහෝන්නට කවර දුකෙක් උපන් දැ"යි පරීක්ෂා කොට බලන්නාහු ප්‍රහාර මුඛයෙන් වැහෙන්නා වූ ලේ දැක ප්‍රිය වූ ස්වාමි පුත්‍රයා කෙරෙහි සෝකය දරා ගත නොහී ආක්‍රෝශ බෙණෙමින් මහ හඬින් හඬන්ට වන්හ.

(i) කිඳුරහන බෝසතුන් ඊ පහරකට ලක් වූ බව දැන නොගැනීමට හේතුව කුමක් ද?
(ii) කිඳුරියට ශෝකය දරාගත නොහැකි වූයේ ඇයි?
(iii) 'ස්මෘති විප්‍රයෝගී ව අනික් ඇලයට පෙරළී වැද හොත්තේ ය' මෙය ලිහිල් බසින් ලියන්න.
(iv) **'විසංඥ ව'** යන්නට කෙටි විවරණ සපයන්න.

(ලකුණු 04 යි)

**(ඊ)** එකල නන්දිය වෙළෙඳාණන්ගේ භාර්‍යාවෝ උත්සව බලනු සඳහා ඉස් ශෝධා නහා සර්වාභාරණයෙන් සැරහී දාසි සමූහයා පිරිවරා එක් දාසියක ඇඟ එල්බ ගෙන ශරීරභාගයක් පෙනෙන සේ මතු මහල් තෙලෙහි උත්සව බලබලා සිටියහ. එකල්හි අමාත්‍යයා දෙපස **වීථිවින්‍යාස සැරහීම්** බලබලා සතුටු සතුටු ව යනුයේ උඩුමහල් තෙලෙහි සිට වීථිය දසාව බැලූ වෙළෙඳ භාර්‍යාව දැක උන්ගේ රූප නමැති සුරාපානයෙන් එම විට උමතු ව ගියා සේ මූර්ඡා ව භ්‍රාන්ත ව ගිය සිත් ඇති ව තද භීයකින් විත් කෑ මුවකු සේ වෙළෙඳ භාර්‍යාවන්ගේ මඳලස බැලුම් නමැති ශරප්‍රහාරයෙන් මූර්ච්ඡා ව දැසින් වැහෙන කඳුළු ධාරා නමැති රුධිරයෙන් රැඳී විරූපභාවයට පැමිණියා වූ මුහුණු ඇති ව අඬඅඬා පෙරළෙමින් තමා හා එක් ව යන්නවුන් බණවා "එම්බා නැයෙනි, යහළුවෙනි, මිත්‍රයෙනි, තෙල උඩුමාලේ දෙවඟනක සේ සිටිනෝ කවුරු ද, කාගේ දියෙණි කෙනෙක් දැ"යි විචාළේ ය.

(i) වෙළෙඳ භාර්‍යාව උත්සවය බැලීමට පැමිණ සිටියේ කෙසේ ද?
(ii) අමාත්‍යවරයා පත් වූ අපහසුතාව දැක්වෙන උපමාව කුමක් ද?
(iii) 'වෙළෙඳ භාර්‍යාවන්ගේ මඳලස බැලුම් නමැති ශරප්‍රහාරයෙන් මූර්ච්ඡා ව' මෙය ලිහිල් බසින් ලියන්න.
(iv) **'වීථිවින්‍යාස සැරහීම්'** යන්නට කෙටි විවරණ සපයන්න.

(ලකුණු 04 යි.)



iexamhub
www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers Model Answers - Study Resources

(උ)

| | |
|---|---|
| මෙන් රිවි සඳ | කිරණ |
| දිව රෑ දිලෙන | මෙදෙරණ |
| ඔහු සොමි ගුණ | තෙදණ |
| කෙළේ මුළු ලොවට වැඩ | අපමණ |
| ඔහු තෙද | දිවසකර |
| දිලිහෙත විකුම් ගිරි | සිර |
| පෙර සිටි රඟ | නොහැර |
| සිටිද පෙර රද යස | **තුසරකර** |

(i) සඳ - හිරු එළියට සම කොට දක්වන්නේ රජුගේ කවර ගුණයන් ද?
(ii) වික්‍රමය නමැති ගිරි හිසෙහි බැබළෙන්නේ කුමක් ද?
(iii) 'පෙර සිටි රඟ නොහැර' මෙය ලිහිල් බසින් ලියන්න.
(iv) '**තුසරකර**' යන්නට කෙටි විවරණ සපයන්න.

(ලකුණු 04 යි)

- **(ඌ)** සහ **(එ)** ප්‍රශ්න දෙකට ම පිළිතුරු සපයන්න.

**(ඌ)** පහත සඳහන් උද්ධෘත අතුරෙන් හතරක අවස්ථා සම්බන්ධය දක්වන්න.

i. 'එ විතරක් වී නම් මුසුප්පුවන්ට නොකැමැත්තේය'
ii. 'යම් කිසි කෙනෙකුන්ගේ මුහුණ එක් ඇසකින් හොබින්නේ නොවෙයි'
iii. 'පළමුත් මූ තුමූ තොපට අනර්ථව සිටියෝ වේද'?
iv. 'හුණු කැමති සිහිල ලැබේල. සිහිල් කැමති හුණු ලැබේල.'
v. 'කිරි නැතුව ඌ කොච්චර බඩගින්නකින් ද ඉන්න ඇත්තෙ'
vi. 'පොඩි වැඩක් තියෙනව කොරන්න. තව පොඩ්ඩෙදි මේ කතාවෙන් ඒක අමතක වෙනව'
vii. 'ලද්දෙමි වෙමි මගෙ දිවියේ අගනා පල
සුවිසාලය මට අත් වූ වාසනාව'

(ලකුණු 03 x04 = 12 යි.)

**(එ)** ළමා කාව්‍ය නිර්මාණයක විශේෂතා කෙරෙහි අවධානය යොමු කරමින් පහත සඳහන් කාව්‍ය නිර්මාණය පිළිබඳ රසාස්වාදයක් කරන්න.

**සමනලයා**

| | |
|---|---|
| නුබ තල ළහිරු බබළයි උණුසුමිය | පවන් |
| බිඟු කැල උරයි වන මල් රොන් රසය | නවන් |
| එහි ලොල නොවී පියඹා ආ ගමන | මෙවන් |
| සමනොල මිතුර නුඹටයි මගෙ | ආයුබොවන් |
| දඹ රන් සුණෙන් හෙබි සිරියල් | තලාවක |
| සුබ සිරි හඳුන්වා සුපුරුදු | වෙලාවක |
| සිඹ සිඹ කුඩා ගස් වන මල් | බලා නෙක |
| නුඹ ආ ගමන සීපද | ගායනාවෙක |
| ගන නිල් තණග පිනි ටික ටික | මැකෙද්දී |
| සුවිසල් අරුණු දද පෙරඹර | දිලෙද්දී |
| රොනවුල් සුළං රැළි දකුණෙන් | වැදෙද්දී |
| සිරියල් බිමෙක විද නුඹ හිරු | නැගෙද්දී |



iexamhub
www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers Model Answers - Study Resources

හේන්වල මුවන් වට පිට බලද්දී
රාං කුරුල්ලන් තුති ගී කියද්දී
පාන්දර හීන් හිරිකඩ වැටෙද්දී
නේන්, හඳුනන්ට බැහැ මල් පිපෙද්දී

තම තුනු කැලුම් සිලිලෙන් නැහැවෙවී වරෙන්
මල් වාරමක ගතියෙන් නැළවෙවී වරෙන්
කවුරුත් නුඹට ආදරයයි, එදැන වරෙන්
සමනොල පුස්පරාගය මා ළඟට වරෙන්

(ලකුණු 12 යි)

**2.** කථා වස්තු රසවත් ව කියාපෑමේ දී ධර්මසේන හිමියන් අවස්ථෝචිත ව උපමා භාවිතයට දක්වන කුසලතාව කෙබඳු දැයි නිර්දිෂ්ට කථා පුවත් ආශ්‍රයෙන් විමසන්න.

**නැතහොත්**

"එකිනෙකට වෙනස් අවස්ථා හමුවෙහි මිනිස් සන්තානයෙහි හටගන්නා සිතුවිලිවල සංකීර්ණ ස්වභාවය නිරූපණය කිරීමෙහි ලා ජාතකකථාකරුවා සමත් වෙයි." නිර්දිෂ්ට කථා ආශ්‍රයෙන් මේ අදහස සනාථ කරන්න.

(ලකුණු 15 යි)

**3.** "පුද්ගල හා අවස්ථා වර්ණනයේ දී ධර්මකීර්ති හිමියෝ විවිධත්වයෙන් යුතු ව භාෂාව හසුරුවති." සද්ධර්මාලංකාරයේ නිර්දිෂ්ට කථා ආශ්‍රයෙන් මේ අදහස පැහැදිලි කරන්න.

**නැතහොත්**

සාරවත් ජීවන අත්දැකීම් උකහා ගනිමින් දිවි මග සාර්ථක කර ගැනීම් වස් පූජාවලියෙන් ලැබෙන පිටුබලය කෙබඳු දැයි නිර්දිෂ්ට කථා ඇසුරෙන් පෙන්වා දෙන්න.

(ලකුණු 15 යි)

**4.** **(අ)** කෝට්ටේ අවධිය සිංහල පද්‍ය සාහිත්‍යයේ ස්වර්ණමය යුගය ලෙස හැඳින්වීමේ යුක්ති සහගත බව නිදසුන් ඇසුරෙන් පහදන්න.

(ලකුණු 07 යි)

**(ආ)** "ගුත්තිල කාව්‍යයෙහි එන මූසිල තම අරමුණ සාක්ෂාත් කර ගැනීමෙහි ලා නොපසුබට උත්සාහයෙන් කටයුතු කරන්නෙකි." උචිත නිදසුන් ඇසුරෙන් පහදන්න.

(ලකුණු 08 යි)

**5.** දුෂ්ට සමාජ බලවේග හා සොබාදහමේ අකාරුණිකත්වය හමුවේ ගැමි ගැහැනුන් පත් වන පීඩාව සානුකම්පික ලෙස ඉදිරිපත් කිරීමට නවකතාකරුවා දක්වන සාමර්ථ්‍යය බැද්දේගම නවකතාව ඇසුරෙන් නිදසුන් දක්වමින් විමසන්න.

(ලකුණු 15 යි)



www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers Model Answers - Study Resources
iexamhub

6. “පීඩිත පන්තිය මුහුණ දෙන අනේකවිධ දුක්ඛදෝමනස්සයන් නූතන කෙටිකතාකරුවෝ කලාත්මක ව ප්‍රතිනිර්මාණය කරති” නිර්දිෂ්ට කෙටිකතාවලින් සුදුසු නිදසුන් **තුනක් වත්** ඇසුරෙන් විස්තර කරන්න.

(ලකුණු 15 යි)

7. අතීතාවර්ජන ලෙසින් හටගත් පුද්ගලානුභූතීන් රසාත්මක ව රසිකයා තුළ ප්‍රතිනිර්මාණය කිරීමෙහි ලා නූතන කවීන් ගන්නා ප්‍රයත්නය නිර්දිෂ්ට කාව්‍ය නිර්මාණ **තුනක්** වත් ආශ්‍රයෙන් නිදසුන් දක්වමින් විස්තර කරන්න.

8. “පෙමතො ජායතී සොකො” නාට්‍යයේ නිරූපිත ස්වර්ණතිලකා ප්‍රායෝගික ජීවිත අත්දැකීම්වලින් හෙබි තැනැත්තියකි” සුදුසු නිදසුන් **තුනක් වත්** දක්වමින් පැහැදිලි කරන්න.

(ලකුණු 15 යි)

***



www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers Model Answers - Study Resources
iexamhub

**අධ්‍යාපන අමාත්‍යාංශය**
கல்வி அமைச்சு
**Ministry of Education**

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2024
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2024
General Certificate of Education (Adv.Level) Examination, 2024

සිංහල II
சிங்களம் II
Sinhala II

**71 S II**

*පැය තුනයි*
*மூன்று மணித்தியாலம்*
*Three hours*

**අමතර කියවීම් කාලය - මිනිත්තු 10යි**
மேலதிக வாசிப்பு நேரம் - 10 நிமிடங்கள்
Additional Reading Time-10 minutes

**අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේ දී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදා ගන්න.**

උපදෙස්:

(i) **I** කොටසේ **1**ප්‍රශ්නය ද, **II** කොටසේ **2,3** ප්‍රශ්න ද, ඇතුළු ව ප්‍රශ්න **පහකට** පිළිතුරු සපයන්න.
(ii) **1** ප්‍රශ්නයේ ඇති **සියලු ම** අනුකොටස්වලට මේ **ප්‍රශ්න පත්‍රයේ ම** පිළිතුරු සපයන්න.
**(iii) I** කොටස, **II** කොටසේ පිළිතුරු පත් සමග **අමුණා භාර දෙන්න.**

## I කොටස

1. එක් එක් ප්‍රශ්නයට වඩාත් ම ගැළපෙන පිළිතුර තෝරා ගෙන, **එයට හිමි අංකය වරහන තුළ ලියන්න.**

1.1 **'ඥාන'** යන්නෙහි අන්තර්ගත අක්ෂර අයත් වන්නේ කවර වර්ගයකට ද?

(1) මූර්ධජ හා දන්තජ
(2) කණ්ඨජ හා තාලුජ
(3) තාලුජ හා මූර්ධජ
(4) තාලුජ හා දන්තජ
(5) දන්තෞෂ්ඨජ හා තාලුජ ය (.....)

1.2 නිවැරදි අක්ෂර වින්‍යාසය සහිත පද පේළිය තෝරන්න.

(1) දෘෂ්ටිපතය, ප්‍රාශංගික, සංෂ්ලේශණය, කළ්‍යාණ, ආභාෂය
(2) දෘෂ්ඨිපථය, ප්‍රසාංගික, සංස්ලේසණය, කල්‍යාන, ආභාශය
(3) දෘෂ්ටිපථය, ප්‍රාසංගික, සංශ්ලේෂණය, කල්‍යාණ, ආභාසය
(4) දෘෂ්ටිපථය, ප්‍රාසාංගික, සංශ්ලේෂණය, කළ්‍යාණ, ආභාසය
(5) දෘෂ්ටිපතය, ප්‍රසාංගික, සංස්ලේෂනය, කල්‍යාන, ආභාෂය (.....)

1.3 අකාරාදි පිළිවෙළ අනුව නිවැරදි ව ලියා ඇති පද පේළිය තෝරන්න.

(1) කොළඹ, කෘත්‍රිම, කෞතුකාගාරය, ක්‍රියාවලිය, කුතුහලය
(2) පාසල, පින, ප්ලාවිත, ප්‍රකාශන, පංචායුධ
(3) ආගාධ, ආවේග, ආවේශ, ආලිංගන, ආංගික
(4) මිථ්‍යා, මෘදු, මොනරා, ම්ලේච්ඡ, මෞර්ය
(5) චංචල, චක්ෂුරින්ද්‍රිය, චතුෂ්ක, චපල, චරණ (.....)



www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers Model Answers - Study Resources

1.4 පහත දැක්වෙන ප්‍රකාශ අතුරෙන් නිවැරදි ප්‍රකාශය තෝරන්න.

(1) ප්‍රථමා හා ආලපන විභක්ති, විභක්ති සමාසයෙහි ලා නො ගැනේ.
(2) නාම ප්‍රකෘතියකට ප්‍රත්‍යයක් එකතු වීමෙන් කෘදන්ත නාම පද සෑදේ.
(3) ක්‍රියා මූලයකට ප්‍රත්‍යයක් යෙදීමෙන් සෑදෙන්නේ තද්ධිතයකි.
(4) සිංහලයේ නිපාත පද බොහෝ විට යෙදෙනුයේ වාක්‍ය ආරම්භයේ දී ය.
(5) සංඥා නාම සර්ව නාම යනුවෙන් ද හැඳින්වෙයි.

(.....)

1.5 එකිනෙකට අනුරූප වන සේ වචන යුගල යෙදී ඇති වරණය තෝරන්න.

(1) සූර්ය තාපය, මෘදු වදන්, සතුටු සාගරය, මාංස භක්ෂණය
(2) හෝරා යන්ත්‍රය, සුබ රාත්‍රියක්, මාර්ග සංඥා, රළු වචන
(3) අග්නි දාහය, පිවිසුම් මග, වෘක්ෂ දේවතාවා, සක්මන් මළුව
(4) ශක්‍ර දේවේන්ද්‍ර, අධ්‍යාපන ඇමති, ශ්වේත රාත්‍රිය, වෙළෙඳ භූමිය
(5) මං සලකුණු, බැති පූජා, වෙසක් උත්සවය, කොරියානු භාෂා (.....)

1.6 තත්සම පද පමණක් යෙදී ඇති වරණය කුමක් ද?

(1) කෑම, නාම, ශ්‍යාම, ධූම
(2) බර, චර, සර, ධුර
(3) බාල, සේල, හීල, කාල
(4) සැප, දීප, රූප, කැප
(5) අෂ්ට, ඉෂ්ට, දුෂ්ට, පිෂ්ට (.....)

1.7 තද්භව වචන පමණක් අන්තර්ගත වරණය කුමක් ද?

(1) පුද, යුද, තෙද, නද
(2) ජල, දල, විල, බිල
(3) ගොනු, හනු, තනු, ධනු
(4) මල, කුල, තාල, මූල
(5) ලක, දුක, ශාක, සෝක (.....)

1.8 විභක්ති, විශේෂණ, අන්‍යාර්ථ සහ අව්‍යය යන සමාස පද අනුපිළිවෙළින් දක්වා ඇති වරණය තෝරන්න.

(1) ලියකොමල, බරනෙත, අනදර, සරාසඳ
(2) සරාසඳ, අනදර, ලියකොමල, බරනෙත
(3) බරනෙත, සරාසඳ, අනදර, ලියකොමල
(4) සරාසඳ, ලියකොමල, බරනෙත, අනදර
(5) බරනෙත, සරාසඳ, අනදර, ලියකොමල (.....)

1.9 කෘදන්තයක් **නොවන** පදයක් අන්තර්ගත වරණය තෝරන්න.

(1) පැමිණිලි, සැලකිලි, ඇතිරිලි, ඇලපිලි
(2) පාදන, සාදන, වාදන, තර්ජන
(3) විද්‍යමාන, ශෝභමාන, ධරමාන, වර්තමාන
(4) ගැටුණු, නැමුණු, මිදුණු, බැඳුණු
(5) විදමන්, කියමන්, හිඟමන්, ලියමන් (.....)



iexamhub www.iexamhub.com Your Trusted Partner for Exam Success Past Papers Model Answers - Study Resources

1.10 පහත දැක්වෙන උද්ධෘතවල **තද කළු අකුරෙන්** මුද්‍රිත පද අයත් ක්‍රියා වර්ගය පිළිවෙළින් දක්වා ඇති වරණය තෝරන්න.

(අ) “සිනා **සිසී** නැඟ එන්නා සූර්යා උදේ…”
(ආ) “කප් සුවහස් කල් පෙරුම් **පුරා ගෙන…**”
(ඉ) “**එන්න** මද නලේ…”
(ඊ) “දණ **ගාද්දී** ඇවිදින්නට මට අත දුන්න…”

(1) පූර්ව ක්‍රියා, මිශ්‍ර ක්‍රියා, විධි ක්‍රියා, අසම්භාව්‍ය ක්‍රියා
(2) අසම්භාව්‍ය ක්‍රියා, විධි ක්‍රියා, මිශ්‍ර ක්‍රියා, පූර්ව ක්‍රියා
(3) මිශ්‍ර ක්‍රියා, අසම්භාව්‍ය ක්‍රියා, පූර්ව ක්‍රියා, විධි ක්‍රියා
(4) විධි ක්‍රියා, පූර්ව ක්‍රියා, අසම්භාව්‍ය ක්‍රියා, මිශ්‍ර ක්‍රියා
(5) මිශ්‍ර ක්‍රියා, පූර්ව ක්‍රියා, විධි ක්‍රියා, අසම්භාව්‍ය ක්‍රියා

(.....)

1.11 තද්ධිතයක් **නොවන** පදයක් අන්තර්ගත වරණය තෝරන්න.

(1) සවනත්, ගගනත්, නුවනත්, මුහුණත්
(2) තාර්කික, වාර්ගික, කාර්මික, ධාර්මික
(3) පාපතර, එඩිතර, සුළුතර, අමතර
(4) කුශලතා, විරෝධතා, අවහිරතා, ප්‍රවීණතා
(5) කරටි, දිගටි, ඉහටි, තුනටි

(.....)

1.12 උපසර්ගයක් යෙදී **නැති** පදයක් සහිත පද පේළිය තෝරන්න.

(1) විමල, විරල, විකල, විචල
(2) පිළිතුරු, පිළිවෙළ, පිළිසඳර, පිළිසකර
(3) අබිමන්, අබිරහස්, අබිසෙස්, අබිදම්
(4) අනිසි, අගුණ, අගරු, අවිදි
(5) පිරිපුන්, පිරිපහදු, පිරිසිදු, පිරිනිවන්

(.....)

1.13 නිපාතයක් **නොවන** පදයක් අන්තර්ගත වරණය තෝරන්න.

(1) හෙට, නිතර, සදා, ඉක්බිති
(2) වැළි, නැවත, පිළි, ආපිට
(3) තෙක්, දක්වා, තුරු, සිට
(4) පිණිස, පොබයා, අරබයා, උදෙසා
(5) ලෙස, බඳු, එව්, වන්

(.....)

1.14 "**පාඨශාලාන්තර** විවාද තරගයෙන් අප **විද්‍යාලයීය** ජ්‍යෝෂ්ඨ අංශයේ **ශිෂ්‍යාශිෂ්‍යාවෝ** ප්‍රථම ස්ථානය ලැබූහ." යන වාක්‍යයෙහි වචන යෙදී ඇති පිළිවෙළ අනුව **තද කළු අකුරෙන්** දක්වා ඇති පද අයත් වන්නේ කුමන ව්‍යාකරණ අංගවලට ද?

(1) සන්ධි, තද්ධිත, සමාස
(2) සමාස, තද්ධිත, සන්ධි
(3) සන්ධි, සමාස, තද්ධිත
(4) තද්ධිත, සන්ධි, සමාස
(5) සමාස, සන්ධි, තද්ධිත (.....)



www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers Model Answers - Study Resources
iexamhub

1.15 සමාන ව්‍යාකරණ ලක්ෂණ නිරූපණය කරන ක්‍රියා රූප සහිත වරණය තෝරන්න.

(1) කියව, බලව, දෙව, කියග
(2) ඇඹරෙමින්, දකිමින්, බලද්දී, වැටෙමින්
(3) කන්නේ ය, යන්නේ ය, බලන්නේ ය, හුන්නේ ය
(4) මැරී, බැලූ, නැටූ, දැරූ
(5) කියත, පනිත, සිටිත, දකිද්දී (.....)

1.16 සමාසයක් **නොවන** පදයක් අන්තර්ගත වරණය තෝරන්න.

(1) නිකරුණේ, සුනිත්‍ය, අවිදූ, අනවසර
(2) අනලස්, පාපහර, වරලස, ගම්වැසි
(3) මුදුපහස, කයීනජලය, තරුඅකුරු, දෙනුවර
(4) බලුකපුටු, හිරුසඳු, සගමොක්, තුරුලතා
(5) දසබල, පන්සිළු, සහසැස්, සියපත් (.....)

1.17 එක ම වර්ගයට අයත් **සන්ධි පද** පමණක් ඇතුළත් වරණය තෝරන්න.

(1) සිත්තරු, හග්ගල, පොල්ලත්ත, හිඟුරල
(2) තුම්මෝදර, කුකුළල, ගනඳුර, සුරත
(3) රියැදුරු, වමැස, රත්මලාන, ඉන්නල
(4) හිතෝපදේශ, විද්‍යෝදය, ධනේශ්වර, අත්‍යුත්තම
(5) හග්ගෙඩිය, ලිග්ගල, වප්පිහිය, රුප්පා

(.....)

1.18 ව්‍යාකරණානුකූල ව **නොගැළපෙන** වරණය තෝරන්න.

(1) කියන, ලියන, වියන, තියන
(2) අවනඩු, අවවාද, අවබෝධ, අවනම්බු
(3) ධීමත්, රූමත්, තාමත්, ශ්‍රීමත්
(4) මුහුදුදිය, වනමල්, මකුළුදැල, චර්මරෝග
(5) පිපිච්ච, වැටිච්ච, වෙච්ච, තෙමිච්ච (.....)

1.19 ව්‍යාකරණානුකූල ව නිරවද්‍ය වාක්‍යය තෝරන්න.

(1) ප්‍රේක්ෂකයන්ගෙන් නාට්‍ය ශාලාව පිරී ඉතිරී ගියහ.
(2) අවසන් වටයට තේරුණු නවක ගායකයා හෝ ගායිකාව ජයග්‍රහණය හිමි කර ගන්නී ය.
(3) ඔවුහු උත්සව ශාලාවට පැමිණ අසුන් ගති.
(4) සේවකයෝ වේලාසනින් ම පැමිණ ශුද්ධ පවිත්‍ර කටයුතු නිමා කොට ඇත.
(5) නායකයන් ආදර්ශවත් වෙත් ද පොදු ජනයා ද ඒ මග යනු ඇත. (.....)

1.20 ලේඛන ව්‍යවහාරයට වඩාත් සුදුසු වාක්‍යය සහිත වරණය තෝරන්න.

(1) කලින් ආවත් ඇයට කාර්යාල දුම්රිය අල්ලන්න බැරි විය.
(2) කටින් කට යන බොරු ආරංචි ගණන් ගත යුතු නැත.
(3) ඔහු හෙමින් සැරේ ඇවිත් මගේ පිටට තට්ටුවක් දැම්මේ ය.
(4) දිවා රෑ නොතකා වැඩ කිරීමෙන් ජයග්‍රහණය ලද හැකි ය.
(5) වෙන්න තියෙන දේ වැළැක්විය නොහැකි යැයි බොහෝ දෙනා සිතති. (.....)

**



iexamhub
www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers Model Answers - Study Resources

අධ්‍යාපන අමාත්‍යාංශය
கல்வி அமைச்சு
Ministry of Education

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2024
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2024
General Certificate of Education (Adv.Level) Examination, 2024

සිංහල II
சிங்களம் II
Sinhala II

71 S II

## II කොටස

- මෙම කොටසින් **2, 3** ප්‍රශ්න ඇතුළු ව ප්‍රශ්න **සතරකට** පමණක් පිළිතුරු සපයන්න.

02 (අ) පහත සඳහන් පාඨය කියවා අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

සිංහල භාෂාවේ ප්‍රභව කාලය නිශ්චය කිරීමේ දී, ඕනෑ ම භාෂාවක කාලයත් සමග ස්වාභාවික ව සිදු විය හැකි පරිණාමයට අමතර ව, ලක්දිව ආදිවාසී ගෝත්‍රික ජනයාට නවාවාසිකයන්ගේ භාෂාවට අනුවර්තනය වී මුළුමනින් එම ජන සමාජයෙහි අන්තර්ග්‍රහණය වීමට අවශ්‍ය වූ කාල පරිච්ඡේදය - එනම්, නවාවාසිකයන්ගේ පළමු-දෙපරපුරෙහි පටන් තවත් පරම්පරා තුනක / හතරක කාලයක්, - ඉඩ හළ යුතු වෙයි. මේ අනුව ප්‍රථම ආර්ය ජනාවාස පිහිටුවීමෙන් සියවස් එකහමාරක/දෙකක පමණ කාලය තුළ දී ස්වාධීන භාෂාවක් සෙයින් සිංහල ප්‍රාකෘතයේ ප්‍රභවය සිදු වන්නට ඇතැයි අනුමාන කළ හැකි ය. තවත් අයුරකින් බලතොත් සිංහල ප්‍රාකෘතයේ ප්‍රථම ලිඛිත නිදර්ශන හමු වන කාලය වූ ක්‍රි. පූ. තෙවන සියවස තෙක් විහිදෙන සියවස් දෙකහමාරක් හෝ තුනක් හෝ පමණ වූ මුළු කාල පරිච්ඡේදය ම සිංහල ප්‍රාකෘතයේ සම්භව කාලය සේ ගත හැකි බව පෙනේ.

මිහිඳු මහ තෙරුන් ලක්දිවට පැමිණි පළමු දිනයෙහි පටන් ම දෙවනපෑතිස් රජු ඇතුළු ලක්වැසි සිංහලයන් සමග පහසුවෙනුත් සාර්ථක ලෙසත් සන්නිවේදන කටයුතු කර ගත හැකි වූයේ උන් වහන්සේ කථා කළ මධ්‍ය ඉන්දු-ආර්ය ප්‍රාකෘතය සිංහල ප්‍රාකෘතයෙන් එතරම් වෙනස් නුවූ නිසා යැයි තර්ක කළ හැකි ය. එහෙත්, තෘතීය ධර්ම සංගායනාවසානයෙහි විවිධ දේශවලට ධර්මදූතයන් පිටත් කර හැරීමේ දී ලක්දිවට පැමිණීමට නියමිත වූ මිහිඳු මහ තෙරුන් කෙළින් ම මෙහි නොපැමිණ පළමු ව වේදිසගිරියට ගොස්, එහි චේතියගිරි විහාරයෙහි සුදුසු කල් බලමින් ගත කළ මාස කීපය තුළ දී සිංහල ප්‍රාකෘතයෙහි වූ විශේෂ ලක්ෂණ පිළිබඳව අවබෝධයක් ලබා ගන්නට ඇතැයි සිතීම වඩාත් තර්කාන්විත ය. ධර්මදූත කාර්යයෙහි යෙදවූ තෙරුන් වහන්සේ සියලු දෙනා ම නිරුක්ති ප්‍රතිසම්භිදාප්‍රාප්තයන් වූ හෙයින්, ඒ සඳහා අවශ්‍ය භාෂා ව්‍යවහාර කුශලතාව ඉක්මනින් ලබා ගැනීමේ හැකියාව උන් වහන්සේට තිබෙන්නට ඇත.

සිංහල භාෂාවේ ප්‍රභව කාලය මේ අයුරින් නිශ්චය කිරීමේ දී, එහි ප්‍රභවය සිදු වූයේ කොහි ද යන ප්‍රශ්නයට ද නිතැතින් පිළිතුරු සැපයේ. එම විවරණයට අනුව, සිංහල ප්‍රාකෘතය ඉන්දියාවෙහි ප්‍රභව වූවක් නොව ලක්දිව දී ම ප්‍රභවය ලද්දක් බව පැහැදිලි වන හෙයිනි. එපමණක් නොව එම විවරණයෙන් ම එහි ප්‍රභවය සිදු වූයේ කෙසේ ද යන ප්‍රශ්නයට ද පිළිතුරු සැපයී ඇත. සිංහල ප්‍රාකෘතය පැන නැගුණේ උතුරු ඉන්දියාවෙන් ලක්දිවට වාර කිහිපයක දී පැමිණි ප්‍රථම ආර්ය ජානපදිකයන් කථා කළ පැරණි ඉන්දු-ආර්ය ප්‍රාකෘතයක් මවු රටේ මවු බස හා පැවති නිරන්තර සම්බන්ධතාව බිඳී ක්‍රමයෙන් වෙනස් වීමෙහි ප්‍රතිඵලයක් වශයෙනි.

(i) නව භාෂාවක ප්‍රභවය සිදු වන්නේ කවරාකාරයෙන් ද?
(ii) සිංහල ප්‍රාකෘතයේ පැරණි ම ලේඛන නිදර්ශන කවර කාලයකට අයත් ද?
(iii) මිහිඳු හිමියන්ට සාර්ථක ව සන්නිවේදන කාර්යයෙහි යෙදිය හැකි වූයේ කවර හේතු නිසා ද?
(iv) ලේඛකයා පවසන පරිදි සිංහල ප්‍රාකෘතයේ ප්‍රභවය සිදු ව ඇත්තේ කොහි දී ද?
(v) ආර්ය සංක්‍රමණිකයන් පැමිණෙන විට මේ දිවයිනෙහි විසූ ජනයා කථා කළ භාෂා හඳුන්වා ඇත්තේ කවර නාමයකින් ද?
(vi) මේ ලේඛනයට අනුව සිංහල ප්‍රාකෘතයේ ප්‍රභවය සිදු වීමට බලපෑ කරුණ කුමක් ද?

(ලකුණු 02×6 = 12 යි)



www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers - Model Answers - Study Resources
iexamhub

**02.** (ආ) පහත දැක්වෙන උද්ධෘතය කියවා, එහි වචන සංඛ්‍යාව **තුනෙන් එකක් පමණ වන සේ** සාරාංශ කොට ලියා, සාරාංශය අග වචන සංඛ්‍යාව ද සඳහන් කරන්න.

'සමාජ උපභාෂා' ගැන සඳහන් කරතොත් එය කුල භේදය හා පන්ති භේදය අනුව භාෂා ව්‍යවහාර වෙනස් ස්වරූප ගැනීම නිසා සිදු වන්නකි. කුල උපභාෂා සඳහා ප්‍රකට උදාහරණයක් ලෙස භාරතයේ තමිල්නාඩු ප්‍රාන්තයේ භාවිත වන දෙමළ භාෂාවේ බ්‍රාහ්මණ කුලිකයන් හා බ්‍රාහ්මණ නොවන්නන් අතර පවතින භාෂාමය වෙනස්කම් දැක්වීමට පුළුවන. වෙනත් සමාජ ප්‍රභේදයක් වන පන්ති භේදය ප්‍රබල ව පවතින එංගලන්ත සමාජයේ භාවිත වන ඉංගිරිසි භාෂාවේ 'ඉහළ' හා 'පහළ' පන්තිවල කථා ව්‍යවහාරයේ පැහැදිලි වෙනස්කම් දැක්ක හැකි වීම පන්ති උපභාෂා සඳහා මහගු උදාහරණයක් ලෙස සැලකේ. එබඳු ප්‍රදේශීය හා සමාජීය විවිධතා භාෂාව අභ්‍යන්තරයේ පවතින නමුත් සමස්ත වශයෙන් එකී භාෂාව තනි ඒකකයක් ලෙස සලකනු ලැබේ.

කෙබඳු උපභාෂාමය විවිධතාවක් පැවතුණ ද තමන් කිසියම් සුවිශේෂ භාෂා සමාජයකට අයත් යැයි භාෂකයෝ සිතත් නම්, පිළිගනිත් නම්, ඒ අනුව ක්‍රියාත්මක වන්නෝ නම් සමාජීය වශයෙන් වැදගත් වන්නේ එය යි. මී ළඟට සලකා බැලිය යුත්තේ 'ජාතික අනන්‍යතාව' යනුවෙන් හඳුන්වනු ලබන්නේ කුමක් ද යන්න ය. නිරුක්ති වශයෙන් ගත හොත් 'අනන්‍ය' යන්න සෑදෙන්නේ 'න'- 'අන්‍ය' එනම් 'අනෙකක් නො වන' යන අරුත් ඇති පද දෙකක එකතුවෙනි. "අපි සිංහල" යැයි කියන විට අන්‍ය වූ 'දෙමළ', 'චීන', 'ජර්මන්' ආදි සකල විධ ස්වභාව බැහැර කිරීමක් සමග තමන්ගේ අසහායත්වය හා සුවිශේෂභාවය තහවුරු කරනු ලැබේ. 'ජාතිකත්වය' යන සංකල්පය හා සමග බද්ධ කොට ගෙන ජාතික අනන්‍යතාව ප්‍රකාශ කිරීමක් එම ප්‍රකාශනයෙහි ගැබ් ව ඇත. ජාතික අනන්‍යතාවට පදනම වන්නේ භාෂාව යැයි කිව හැකි වුව ද ඒ හා බැඳුණු තවත් වැදගත් සාධක දෙකක් ඇති බව මෙහි දී අමතක කළ හැකි නො වේ. එනම්, ආගම හා නිජ බිම යන කාරණා දෙක ය.

(ලකුණු 13යි)

**03.** දී ඇති මාතෘකාවලින් එකකට අදාළ ව වචන 300-350 අතර වන සේ විශ්ලේෂණාත්මක රචනාවක් ව්‍යාකරණානුකූල ව ලියන්න.

(i) දේශපාලන සාක්ෂරතාව ප්‍රවර්ධනයෙහි ලා සමාජ මාධ්‍යයේ දායකත්වය
(ii) අසමතුලිත ආහාර රටාව හේතුවෙන් ඇති වන ස්ථූලභාවය හා සමාජ ප්‍රශ්න
(iii) පාසල් සිසුන් පන්ති කාමර තුළ හිරිහැරයට ලක් වීමේ ප්‍රතිවිපාක
(iv) සංවර්ධනය හා මානව මැදිහත්වීමෙන් සිදුවන ආපදා

(ලකුණු 25යි.)

**04.** (අ) පහත සඳහන් වාක්‍යවල සදොස් තැන් ඇතොත් නිදොස් කොට ලියන්න.

(i) සභාපතිවරයා හෝ අධ්‍යක්ෂවරිය හෝ කාර්ය මණ්ඩලය අමතන්නේ ය.
(ii) එම ඇඟලුම් ආයතනයෙහි සේවිකාවෝ සිය ගණනක් ඇත.
(iii) හෙතම මේ අදහස පළ කළේ සම්මාන ප්‍රදානෝත්සවයකට සහභාගී වෙමිනි.
(iv) ප්‍රකට සාහිත්‍යකරුවෙක් වූ මහාචාර්ය එදිරිවීර සරච්චන්ද්‍ර මෙරට නාට්‍ය කලාවට වෙසෙස් මෙහෙවරක් කළේ ය.
(v) සරසවි සිසුන් උද්ඝෝෂණ කරද්දී පොලිස් නිලධාරීන් එය වැළැක්වීමට පියවර ගත්හ.

(ආ) පහත සඳහන් වාක්‍ය කර්මකාරකයට හරවන්න.

(i) විනිශ්චය මණ්ඩලය අවසන් තරගය සඳහා තරගකරුවන් තිදෙනෙකු තෝරා ගත්තේ ය.
(ii) ජනාධිපතිවරයා එක්සත් ජාතීන්ගේ සංවිධානය නියෝජනය සඳහා නව නියෝජිතවරියක පත් කරයි.
(iii) සංවිධායකයෝ උත්සවයට පැමිණි අප මහත් හරසරින් පිළිගත්හ.
(iv) ගම්වැසියෝ රිය අනතුරට ලක්වූවන් කඩිනමින් රෝහල්ගත කළහ.
(v) විදුහල්පතිවරයා ගුරුවරුන් ද සිසුසිසුවියන් ද රැස්වීම් ශාලාවට කැඳවයි.



iexamhub
www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers Model Answers - Study Resources

(ඉ) නිවැරදි වාක්‍යයක් නිර්මාණය කිරීම සඳහා සුදුසු පද වරහන් තුළින් තෝරා ලියන්න.

(i) වැස්සෙන් පසු ගහ කොළ ද (පක්ෂීන්/පක්ෂීහු) ද ප්‍රබෝධයට පත් (විය /වූහ).
(ii) (කලාකරුවෝ/කලාකරුවන්) සමාජ ප්‍රගමනය උදෙසා කැප විය (යුත්තේ ය/ යුත්තාහ).
(iii) ඉන්දීය රජයේ (ඇමතිවරයෙක්/ඇමතිවරයකු) ලබන සතියේ මෙරටට (පැමිණෙති/ පැමිණෙයි).
(iv) (පාලකයෝ/පාලකයන්) ආදර්ශවත් (වේ ද/ වෙත් ද) රටවැසියන් ද යහමග යනු ඇත.
(v) තම (සිසුහු/ සිසුන්) විභාගයෙන් ඉහළින් සමත් වෙති යි (ගුරුවරුන්/ ගුරුවරු) අපේක්ෂා කරති.

(ලකුණු 05×3 = 15යි)

**05.** පහත දැක්වෙන වාක්‍යවල තද කළු අකුරෙන් මුද්‍රිත පදවල ව්‍යාකරණ අංගය දක්වා ඇත. එහි අනු- අංගය දක්වන්න.

(i) **විදුහල්පතිතුමා** ගුරුවරුන් **හා** සිසුන්ගේ බුහුමන් **ලැබ** සේවයෙන් විශ්‍රාම ගියේ ය.
(විදුහල්පතිතුමා-සන්ධි, හා-නිපාත, ලැබ-ක්‍රියා)
(ii) **පොකුණෙහි** සුපිපි **නිලුපුල්** හිරු **බැස යද්දී** මිලින වෙයි.
(පොකුණෙහි-විභක්ති, නිලුපුල්-විභක්ති, බැස යද්දී-ක්‍රියා)
(iii) වේදිකාවට **පැමිණි** කුඩා **දරුදැරියෝ** මහත් **උද්‍යෝගයෙන්** රංගනයක යෙදුණහ.
(පැමිණි-කෘදන්ත, දරුදැරියෝ-සමාස, උද්‍යෝගයෙන්-විශේෂණ)
(iv) මතු **පරපුරට** ජීවත් වීමට සුදුසු **සුරක්ෂිත** රටක් **ගොඩනැගීම** වැඩිහිටියන්ගේ යුතුකමකි.
(පරපුරට-විභක්ති, සුරක්ෂිත-අව්‍යය පද, ගොඩනැගීම-කෘදන්ත)
(v) **අරුණලු** කැන්වලට ඉඩදෙනු **වස්** නිශා තොමෝ **තරුපහන්** නිවා දැමුවා ය.
(අරුණලු-සන්ධි, වස්-නිපාත, තරුපහන්-සමාස)

(ලකුණු 05×3 = 15යි)

**06.** (අ) පහත දැක්වෙන ඡේදයෙහි හිස්තැනට වඩාත් ම ගැළපෙන පදය වරහන තුළ දී ඇති පද අතුරෙන් තෝරා ලියන්න.

වසරක් පාසා පැවැත්වෙන ....................... ගී සැදෑව මෙවර ද සඳගමුව මධ්‍ය ....................... විද්‍යාලයීය ක්‍රීඩාංගණයේ දී උත්සවාකාරයෙන් පැවැත්විණි. නානාවිධ ....................... දිදුලන විදුලි බුබුළුවලින් වේදිකාව හා අවට පරිසරය අලංකාර විය. නන් ....................... යුත් විසිතුරු ඇඳුමෙන් සැරසී ගී ගැයූ ..................... යෞවනියෝ කාගේත් අවධානයට ලක් වූහ. ප්‍රසංගය නැරඹීමට පැමිණි රසිකරසිකාවන්ගෙන් ..................... විදුහල් බිම පිරී ගියේ ය.

(වර්ණයෙන්, යොවුන්, පැහයෙන්, මහා, යෞවන, මහ)

(ලකුණු 1/2×6 = 03යි)

(ආ) පහත දක්වා ඇති පද සන්ධි කර දක්වන්න.

(i) නරන් + ඉඳු (ii) සූ + අසූ (iii) අත් + ලස්
(iv) සාධු + උක්ති (v) දෙ + අත (vi) රිය + ඇඳුරු

(ලකුණු 1/2×6 = 03යි)

(ඉ) තද කළු අකුරෙන් මුද්‍රිත පදවල විභක්ති නම් කරන්න.

(i) අතුපතරින් ගහන **තුරුලියගොමු** කුඩා **පක්ෂීන්ට** වාසස්ථාන සලසයි.
(ii) රෝහලේ දැඩිසත්කාර **ඒකකයෙහි** ප්‍රතිකාර ලැබූ රෝගියා වෛද්‍ය **ප්‍රතිකාරවලින්** සුවය ලැබී ය.
(iii) "**අහසින්** වැටෙන හැම වැහි බිඳුවක් ම අපතේ නොහැර ප්‍රයෝජනයට ගත යුතු ය." යන්න **මහපැරකුම්බාවන්ගේ** ප්‍රකාශයකි.

(ලකුණු 1/2×6 = 03යි)



www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers Model Answers - Study Resources
iexamhub

(ඊ) අවශ්‍ය තැන්වල විරාම ලක්ෂණ යොදා පහත දැක්වෙන කොටස නැවත ලියන්න.

සුව පහසුවට විලාසිතාවට අකමැති කවුද ඒ නිසා විදුලි එළියෙන් බබළන දෙතුන් මහල් පහ ඇති ශීඝ්‍රගාමී රථවාහන ආදියෙන් කලබල වූ මහා වීථි ඇති පෙම් කෙළින මුවන් මෙන් කෙළි දෙළෙන් පසු වන තරුණතරුණියන් සහිත උයන් වතු ඇති මෙසේ නොයෙකුත් අලංකාරයෙන් පිරුණු නගරයන් පිටිසරබද ව ඇති වීම ගැන කන්කෙඳිරි ගාන්නා ඊර්ෂ්‍යාකාරයෙක් නොවන්නේ ද එහෙත් මේ සියලු ඔපය පවත්නේ සාගින්නට උඩින් නම් එය ඔපයක් ලෙස හැඳින්විය නොහැකි ය

(ලකුණු 1/2×6 = 03යි)

(උ) පහත දැක්වෙන ප්‍රකාශවල එක් එක් ප්‍රකෘති කථනය විකෘති කථනයට හරවා නැවත ලියන්න.

(i) "මම ඊයේ මුහුදු වෙරළට ගියෙමි"යි මිතුරා පැවසී ය.
(ii) "අපරාධකරුවන් වහා ම අත්අඩංගුවට ගෙන උසාවියට ඉදිරිපත් කරන්න" යි විනිසුරුවරයා පොලීසියට නියෝග කළේ ය.
(iii) "අපි දිවි හිමියෙන් මත්පැන් නොබොමු"යි ඔවුහු ශපථ කළහ.

(ලකුණු 1×3 = 03යි)

07. පහත දැක්වෙන ඡේදය කියවා අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

පුර්තුගීසි උවදුරෙන් බේරෙත් ම ලංකාවේ මුහුදුබඩ ප්‍රදේශ ඕලන්දකාරයන්ගේ පාලන බලයට යටත් විය. **අවුරුදු** එකසිය පනහක් පමණ පහතරට **ආණ්ඩු** කළ ඕලන්දකාරයෝ ද ශිල්ප ශාස්ත්‍රාදිය දියුණු කිරීමෙහි නිරත නොවූහ. වෙළෙඳාමෙන් ධනෝපායනය ඔවුන්ගේ එක ම **අභිලාෂය** විය. මේ සමයෙහි ස්වාධීන සිංහල රාජ්‍යයක් උඩරට පළාත්වල පැවැති නමුත් දකුණු ඉන්දියානු ද්‍රවිඩ රජවරු එහි රජකම් කළහ. කැඩී බිඳී යන පැරණි රදල ක්‍රමයකින් යුක්ත වූ උඩරට සිංහල සමාජය **අතර** මනුෂ්‍ය ශිෂ්ටාචාරයේ උසස් **අංග** විද්‍යමාන නොවී ය. සිංහල හෝ දමිළ හෝ යම්තම් ලියන්නට කියවන්නට ඉගෙන ගැනීමක් හැර අන් කිසි අධ්‍යාපනයක් එකල උඩරට හෝ පහතරට හෝ නොතිබුණේ ය. අවුරුදු තුන්සියයකට පෙර පටන් පිරිහෙමින් පැවැති චිත්‍රශිල්පයත් සංගීතයත් මේ කාලයේ දී සිංහලයන් **අතුරෙන්** සම්පූර්ණයෙන් ම බැහැර ගොස් තිබුණු බව පෙනෙන්ට ඇත්තේ ය. **ආගමික** කෘත්‍යයන්ට ද යාගහෝමාදියට ද අත්‍යවශ්‍ය වූ නිසා නැටුම් ශිල්පය රක්ෂාවක් කොට ගත් ශික්ෂාකාමී මිනිස්සු නාට්‍ය ශිල්පය **ආරක්ෂා** කළහ. ලංකාවේ පැරණි කලාවන් අතුරෙන් නාට්‍ය ශිල්පය පමණක් සිංහලයන් අතර ශේෂ ව පැවැතුණේ මේ නිසා ය.

(i) ඡේදයේ තද කළු අකුරින් මුද්‍රිත වචන අකාරාදි පිළිවෙළින් ලියන්න.
(ii) නොතිබුණේ ය, ස්වාධීන, ගැනීමත් යන වචනවල පිළි වෙන වෙන ම ලියන්න.
(iii) ගැටය සහිත ඇලපිල්ලක්, රේඵයක්, සඤ්ඤක අකුරක් ඇතුළත් වචනය බැගින් ලියන්න.
(iv) තාලුජ හා මූර්ධජ ඌෂ්මාක්ෂර දෙකක් සහිත වචන තුනක් ලියන්න.
(v) ධනෝපායනය, අත්‍යවශ්‍ය, යාගහෝමාදිය යන වචන විසන්ධි කොට දක්වන්න.

(ලකුණු 05×3 = 15යි)

08. පහත සඳහන් මාතෘකාවලින් තුනක් තෝරා ගෙන කෙටි සටහන් ලියන්න.

(i) ප්‍රයෝජ්‍ය ක්‍රියාව
(ii) පරරූප සන්ධිය
(iii) අර්ධානුනාසිකාක්ෂර (සඤ්ඤක අක්ෂර)
(iv) දකාරාර්ථ සමාසය
(v) පුරුෂවාචී සර්වනාම

(ලකුණු 05×3 = 15යි)

***



www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers Model Answers - Study Resources
iexamhub